සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

08 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 62 S I

# පුරවැසි අධ්‍යාපනය

කාලය පැය දෙකයි

**නම හා විභාග අංකය:**

**අංක 1 සිට 30 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා සපයන ලද පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර හෝ ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ශ්‍රී ලංකාවේ පාසල් සංවර්ධනය කිරීමේ අරමුණින් මිලියන හැට පන්දහසක වියදමක් දරමින් වර්තමානයේ ක්‍රියාත්මක වන ජනප්‍රිය සංකල්පය වන්නේ,
    01. ''මේ ඔබේ දරුවාගේ පාසලයි''. 03. ''සැමට සෙවණ''.
    02. ''ගම් පෙරළිය''. 04. ''ළඟම පාසල හොඳම පාසල".

02. පොදු ප්‍රවාහන සේවාව කාර්යක්ෂම කිරීම සඳහා රජය විසින් විවිධ පියවර ගෙන ඇති අතර ඒ අතරින් විදේශීය ණය ආධාර මත ක්‍රියාත්මක කරනු ලබන විශාල සංවර්ධන ව්‍යාපෘතියක් වන්නේ,
    01. මාර්ග නඩත්තුව හා අළුත් වැඩියාව. 03. අධිවේගී මාර්ග ඉදි කිරීම.
    02. නව බස් රථ ධාවනයට එක් කිරීම. 04. පෞද්ගලික බස් රථ සේවා දියුණු කිරීම.

03. අප ජීවත් වන ප්‍රදේශයේ නීතිය හා සාමය සුරැකීම හා මහජන ආරක්ෂාව සැපයීම ප්‍රධාන කාර්ය භාරයක් වන්නේ,
    01. ග්‍රාම නිලධාරි තුමාගේය. 03. ත්‍රිවිධ හමුදාවේය.
    02. සමෘද්ධි සංවර්ධන නිලධාරි තුමාගේය. 04. පොලිසියේය.

04. රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ගෞරවනීය සමාජ ආරක්ෂණ වැඩ සටහනක් වන්නේ,
    01. වන සංරක්ෂණය. 03. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ශුභ සාධනය.
    02. වෙරළ සංරක්ෂණය. 04. රෝග නිවාරණය.

05. නිදහස් අධ්‍යාපනය පොදු සේවාවක් ලෙස ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වීමට පදනම් වූ නිදහස් අධ්‍යාපනයට අදාළ යෝජනා සම්මත වූයේ කිනම් වර්ෂයකදී ද?
    01. 1940. 02. 1945. 03. 1948. 04. 1957.

06. ප්‍රජාතන්ත්‍රවාදය යන සංකල්පය දෙස ප්‍රධාන වශයෙන් දෙයාකාරයකින් බැලීමට විද්වතුන් සමත් විය. එම දෘෂ්ඨිකෝණ දෙක නිවැරදිව දක්වෙන පිළිතුර වන්නේ,
    01. නිදහස හා සමානාත්මතාව. 03. පාලන ක්‍රමයකි,ජීවන ක්‍රමයකි.
    02. ප්‍රජාතන්ත්‍රවාදය හා නිර්ප්‍රජාතන්ත්‍රවාදය. 04. යුතුකමකි, අයිතිවාසිකමකි.

07. පහත දැක්වෙන්නේ චිත්තවේග හා ඊට අදාළ ප්‍රතික්‍රියාවන්ය. ඒ අතරින් නොගැළපෙන ප්‍රතික්‍රියාවක් ඇතුළත් පිළිතුර වන්නේ,
    01. සතුට - සිනාසීම, කෑ ගැසීම. 03. කෝපය - බැණ වැදීම, පහර දීම.
    02. දුක - හැඬීම, ඔල්වරසන් දීම. 04. බිය - ශරීරය වෙව්ලීම, ගොතගැසීම.

08. සමබර පෞරුෂයකින් හෙබි පුද්ගලයා තුළින් නිරතුරුව පෙනෙන ලක්ෂණයක් වන්නේ,
    01. කලබලකාරී හැසිරීමය. 02. විවේචනය කිරීමය. 03. ආත්මාර්ථකාමී බවය. 04. ආවේගවලට ලක් නොවීමය.

09. නායකයෙකු සතු සන්නිවේදන හැකියාවට හා මානව සම්බන්ධතා පැවැත්වීමේ හැකියාවට අදාළ ගුණාංගයන් අනු පිළිවෙලට දක්වා ඇති පිළිතුර වන්නේ,
    01. ඉදිරිපත් කිරීම - සමාජශීලි බව. 03. කණ්ඩායම් හැසිරීම - සුහද බව.
    02. සුහද බව - සැළසුම් කිරීම. 04. ඉදිරිපත් කිරීම - අරමුණු තීරණය කිරීම.

10. ''සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මිනිසා විසින් අයත් කර ගන්නා වූත්, ලබා ගන්නා වූත් දැනුම විශ්වාස කලා, සදාචාර දහම් හා වෙනත් හැකියාවන්ගේ සමස්තය සංස්කෘතිය නම් වේ'' මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,
    01. මහාචාර්ය විමල් දිසානායක මහතා ය. 03. සමාජ විද්‍යාඥ T.H.ග්‍රීන් මහතා ය.
    02. සමාජ විද්‍යාඥ **E.B.**ටයිලර් මහතා ය. 04. සමාජ විද්‍යාඥ හැරඩල් J. ලැස්කි මහතා ය.

11. 2012 වර්ෂයේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ජන සංගනනයට අනුව ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් ඉහළම ප්‍රතිශතයක් හා පහළම ප්‍රතිශතයක් හිමි කර ගත් ආගම් දෙක අනුපිළිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ,
    01. බෞද්ධ - හින්දු. 03. බෞද්ධ - කතෝලික/ ක්‍රිස්තියානි.
    02. ඉස්ලාම් - ඉස්ලාම්. 04. කතෝලික/ ක්‍රිස්තියානි - ඉස්ලාම්.

12. ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංස්කෘතීන් හැඩ ගැසී ඇත්තේ පහත සඳහන් කවර සාධකයක් මූලික වශයෙන් පදනම් කරගෙන ද?
01. භාෂාව. 02. සිරිත් විරිත්. 03. සම්ප්‍රදායන්. 04. ආගම.

13. ශ්‍රී ලංකාවේ 2004 වර්ෂයේදී මිනිස් ජීවිත 31500 ට වඩා මරණය සිදු කළ ස්වභාවික ව්‍යසන තත්ත්වය වන්නේ,
01. සුළි සුළං. 02. ගං වතුර. 03. නියඟ. 04. සුනාමි.

14. දක්ෂිණ අධිවේගී මාර්ග මෙහෙයුම් හා මාර්ග භාවිතා කරන්නවුන්ට හදිසි අවස්ථාවල ඇමතීමට රජය විසින් ප්‍රකාශයට පත් කර ඇති කෙටි දුරකතන අංකය වන්නේ,
01. 1969. 02. 1984. 03. 1991. 04. 1990.

15. පහත A,B,C නම්කර ඇති මාර්ග සංඥා වලින් කියවෙන අදහස නිවැරදිව අනුපිළවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ,

A  B  C 

01. ඉදිරියෙන් නවතිනු, පාසල ඉදිරියෙන්, වට රවුම ඉදිරියෙන්.
02. පදිකයින් මාරුවන ස්ථානය ඉදිරියෙනි, ළමයින් මාරුවන ස්ථානය ඉදිරියෙන්, වට රවුම ඉදිරියෙන්.
03. වට රවුම ඉදිරියෙන්, පදිකයින් මාරුවන ස්ථානය ඉදිරියෙන්, ඉදිරියෙන් නවතිනු.
04. ළමයින් මාරුවන ස්ථානය ඉදිරියෙන්, පදිකයින් මාරුවන ස්ථානය ඉදිරියෙන්, වට රවුම ඉදිරියෙන්.

16. ගැටලු සම්බන්ධයෙන් පහත ඉදිරිපත් කර ඇති ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශය වන්නේ,
01. යම් කාර්යයක්, තත්ත්වයක් හෝ අවස්ථාවක් කරා ළඟා වීමට ඇති බාධාවකි.
02. පුද්ගල ජීවිතයේදී මෙන්ම සමාජ ජීවිතයේදී ද හමුවන බාධාකාරී තත්වයන්ය.
03. මිනිස් ජීවිතය තුළ මුහුණ දෙන අසාමාන්‍ය හා අහඹු සංසිද්ධියකි.
04. පුද්ගලයාගෙන් පුද්ගලයාට හා අවස්ථාවෙන් අවස්ථාවට සාපේක්ෂ වූවකි.

17. ගැටලුවක් විශ්ලේෂණය කිරීම සඳහා අනුගමනය කළ යුතු පියවර තුන නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
01. ගැටලුව → ගැටලුව නිසා ඇතිවන බලපෑම → ගැටලුව.
02. ගැටලුවට හේතු → ගැටලුව → ගැටලුව නිසා ඇතිවන බලපෑම.
03. ගැටලුව නිසා ඇතිවන බලපෑම → ගැටලුවට හේතු → ගැටලුව.
04. ගැටලුව → ගැටලුවට හේතු → ගැටලුව නිසා ඇති වන බලපෑම.

18. ගැටලුවක් විසඳීමේදී ඔබ ප්‍රගුණ කරගෙන තිබිය යුතු වැදගත්ම කුසලතාවයන් දෙකක් වන්නේ,
01. විචාරශීලී බව හා අවිචාරවත් බව.
02. ත්‍යාගශීලී බව හා නිර්මාණශීලී බව.
03. විචාරශීලී බව හා නිර්මාණශීලී බව.
04. අනුකරණවාදී බව හා අනම්‍යශීලී බව.

19. තම සොයාගැනීම සිදු කිරීමට ගත් උත්සහයන් 9999 ක්ම අසාර්ථක වුවත් එම අභියෝගාත්මකඅවස්ථාව 10000 වාරයේදී ජය ගැනීමට සමත් වූ විද්‍යාඥයා හා එම සොයා ගැනීම නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
01. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් - දුරකතනය.
02. තෝමස් අල්වා එඩිසන් - විදුලි බුබුළ.
03. ගැලිලියෝ ගැලිලි - දුරේක්ෂය.
04. ජෝන් ලොගී බෙයාර්ඩ් - රූපවාහිනිය.

20. තම නිර්මාණශීලි මනස යොදවා ලෝක සංග්‍රාමයෙන් විනාශ වූ ජපානයේ වෙසෙන ජනතාවට ප්‍රවාහන පහසුකම් සළසා දී පසුව මුලු ලෝකයටම ප්‍රයෝජනවත් වූ නිර්මානයක් ඉදිරිපත් කළ ඔහු,
01. සෙයිචිරෝ හොන්ඩායි මහතා.
02. ආතර් සී ක්ලාක් මහතා.
03. චාල්ස් ඩාවින් මහතා.
04. මයිකල් ෆැරඩේ මහතා.

21. වැඩ ලෝකය හා එහි විවිධත්වය පිළිබඳව ඉදිරිපත්ව ඇති නිර්වචන අතර ''වැඩ යනු මිනිසාගේ ජීවත් වීමේ කලාවේ මධ්‍ය ලක්ෂයයි'' යන අදහස් ඉදිරිපත් කරන ලද්දේ,
01. Soanes, 2004. 02. Rooney, 2001. 03. Teichler, 1999. 04. Nick Vujicic, 1980.

22. වැඩ ලෝකයේ විවිධ රැකියා ක්ෂේත්‍ර දක්නට ඇති අතර සේවා අංශයට අයත් රැකියාවක් නොවන්නේ මේ අතරින් කුමක් ද?
01. ප්‍රවාහන නිලධාරි. 02. වෙළඳාම. 03. තැපැල් ස්ථානාධිපති. 04. ගුවන් යානා මෙහෙය වීම.

23. පිත්තල බඩු, වෙස් මුහුණු හා මැටි ආශ්‍රිත නිෂ්පාදන සඳහා වැඩි ප්‍රසිද්ධියක් උසුලන ප්‍රදේශ නිවැරදිව දැක්වෙනි පිළිතුර තෝරන්න.
01. මොළගොඩ, වේවැල්දෙණිය, කජුගම.
02. නුවරඑළිය, ගාල්ල, පිළිමතලාව.
03. පිළිමතලාව, අම්බලන්ගොඩ, මොළගොඩ.
04. අම්බලන්ගොඩ, පිළිමතලාව, මොළගොඩ.

24. වැඩි වශයෙන් මානසික ශ්‍රමය යොදවන රැකියාවක් වන්නේ මේ අතරින් කුමන රැකියාවද?
01. ගොවි. 02. කම්කරු. 03. පෙදරේරු. 04. පරිපාලන.

25. තමන් කරන රැකියාව ගැන තමන් ම අභිමානයක් ඇති කර ගැනීම හඳුන්වන්නේ,
01. අත්මාභිමානය නමින් ය.
02. ජාතිකාභිමානය නමින් ය.
03. ශ්‍රමාභිමානය නමින් ය.
04. ස්වයංඅභිමානය නමින් ය.

26. සමාජයේ ප්‍රගමනයට සම්පූර්ණ විය යුතු අවශ්‍යතාවයක් වන යටිතල පහසුකම් අතරට අයත්වන සාධකයක් වන්නේ,
01. ආහාර. 02. ජලය. 03. නිවාස. 04. ඇඳුම්.

27. සේවක අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා ශ්‍රී ලංකාවේ සලසා ඇති විධිවිදාන වලට අයත් පනතක් වන්නේ,
01. සේවක අර්ථසාධක අරමුදල් පනත.
03. අනිවාර්යය අධ්‍යාපන පනත.
02. උසස් අධ්‍යාපන පනත.
04. ශ්‍රී ලංකා දේශීය සේවා පනත.

28. සේවාලාභින් තෘප්තිමත් කළ හැකි උපාය මාර්ග නවයක් හඳුන්වාදුන් විද්වතා වන්නේ,
01. කාර්ල් ඩී.ජෙරල්ඩ්ය. 02. ජෙරී ග්‍රෙගරිය. 03. ජෝන් ෆොස්මර්ය. 04. චාල්ස් බැබේජ්ය.

29. නාගරික ප්‍රදේශ වල පිහිටි පාසල් වලට තම පාසල් වත්ත තුළ වගා කිරීමට වඩාත් යෝග්‍ය යැයි පෙන්වා දී ඇති ශාක වර්ග 2ක් වන්නේ,
01. අලිපේර - රඹුටන්.
02. කෝමාරිකා - නයිපාන.
03. කොහොඹ - පේර.
04. මාර - කොස්.

30. තිරසර සංවර්ධනය ඇති කිරීමට ඔබට දායක විය හැකි ආකාරයක් වන්නේ,
01. සම්පත් අධිපරිභෝජනය කිරීම.
02. බලශක්ති සංරක්ෂණය.
03. අපද්‍රව්‍ය රිසි සේ බැහැර කිරීම.
04. නීති රීති වලට අනුකූල නොවීම.

## II කොටස

**⋆ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
**⋆ පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න පහක් ඇතුළුව ප්‍රශ්න 6 කට පිළිතුරු සපයන්න.**

01. i. පොදු සේවා පවත්වාගෙන යාමට අවශ්‍ය මුදල් රජයට ලැබෙන ක්‍රම දෙකක් ලියන්න.
ii. බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ සේවා දෙකක් ලියන්න.
iii. ශ්‍රී ලංකාවේ වර්තමානයේ බහුලව දක්නට ලැබෙන බෝ නොවන රෝග දෙකක් ලියන්න.
iv. පවුලේ ස්වභාවය අනුව ඒවා ප්‍රධාන වර්ග දෙකකට බෙදා වෙන් කළ හැකිය. ඒවා නම් කරන්න.
v. ළමා අයිතිවාසිකම් ප්‍රධාන වශයෙන් තේමා හතරකට බෙදා වෙන් කර ඇත. එයින් දෙකක්ද නම් කරන්න.
vi. සමාජය තුළ නායකත්වය යන්න දැකිය හැකි අවස්ථා දෙකක් ලියන්න.
vii. ශ්‍රී ලංකාව හැර බහු සංස්කෘතික ලක්ෂණ මැනවින් දැකිය හැකි රටවල් දෙකක් ලියන්න.
viii. ඖෂධ භාවිතයේදී ඔබ විසින් සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න.
ix. වැඩ ලෝකයේ පවතින රැකියා ප්‍රධාන ක්ෂෙත්‍ර තුනකට බෙදිය හැකිය. ඉන් දෙකක් ලියන්න.
x. පෞද්ගලිකව සෑම පුද්ගලයෙකු විසින්ම තම වෘත්තීය ගුණාංග පුහුණු කර ගැනීම සඳහා භාවිතා කළ හැකි ප්‍රධාන ඉගෙනුම් ක්‍රම හතරකි. ඉන් දෙකක් ලියන්න. ( ලකුණු 10 x 2 = 20 )

02. රජය හා පෞද්ගලික අංශය මඟින් පොදු සේවා සපයනු ලැබේ.
i. අනුරාධපුර රාජධානි සමයේ පොදු සේවාවල විකාශනය සිදු වූ බවට නිදසුන් 2 ක් ලියන්න. ( ල. 02 )
ii. ඔබ ප්‍රදේශයේ දක්නට ලැබෙන පොදු සේවාවන් තුනක් නම් කරන්න. ( ල. 03 )
iii. පාසලේදී ඔබට ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස සම්බන්ධ විය හැකි සමිති සමාගම් දෙකක් නම් කර ඉන් එකක් මඟින් ඔබට යහපත් පුරවැසියෙකු වීමට අවශ්‍ය ගුණාංග ප්‍රගුණ කිරීමට ලැබෙන සහය කෙබඳුදැයි නිදසුන් මගින් පැහැදිලි කරන්න. ( ල. 2 + 3 = 5 )

03. පොදු සේවා අතර පරිසර සංරක්ෂණය යන්න ද ඉතා වැදගත්ය.
i. පරිසර සංරක්ෂණය උදෙසා සේවය සපයන ආයතන දෙකක් නම් කරන්න. ( ල. 02 )
ii. ඉහත පොදු සේවාව සපයන ආයතන වලින් ඉටුවිය යුතු යුතුකම් තුනක් ලියන්න.( ල. 03 )
iii. පොදු සේවා භුක්ති විඳීම සම්බන්ධයෙන් පුරවැසියන් තම යුතුකම් ඉටු කිරීම පොදු සේවාවල පැවැත්මට හා ගුණාත්මක සංවර්ධනයට හේතුවන ආකාරය නිදසුනක් මඟින් පැහැදිලි කරන්න. ( ල. 05 )

04. පවුල හැරුණු විට දරුවෙකුට සමීපතම ආයතනය වන්නේ පාසලයි.

i. පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙකක් ලියන්න. ( ල. 02 )

ii. විවිධ පවුල් පරිසරයන්ගෙන් පැමිණෙන දරුවන්ගෙන් සමන්විත පාසල ඒ සියලු දෙනාටම සමාන අධ්‍යාපන අවස්ථා ලබාදීමට කටයුතු කරයි. මේ සඳහා සෑම පාසලක්ම පොදුවේ ක්‍රියාත්මක කරන ක්‍රියා මාර්ග තුනක් ලියන්න. ( ල. 3 )

iii. ඔබේ පාසල තුළ ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් දෙකක් නම් කරන්න. ඉන් එකක් මගින් පාසල තුළ ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක් පවත්වාගෙන යාමට ලැබෙන සහය කෙබඳුදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

( ල. 2 + 3 = 5 )

05. අපේ සිත් තුළ ඇතිවන විවිධ සිතුවිලි වල ස්වභාවය මුහුණේ ඉරියව් වලින් පැහැදිලි වේ. ( ල. 02 )

i. අයහපත් චිත්තවේග සමනය සඳහා යොදාගත හැකි මනස සන්සුන් කිරීමේ අභ්‍යාස දෙකක නම් කරන්න.

ii. අධ්‍යාපන කටයුතු බහුල වීම හා විභාග පැවැත්වීම පදනම් කර ගෙන සිත තුළ ඇති වන මානසික පීඩනය අවම කර ගැනීමට ඔබට අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග තුනක් ලියන්න. ( ල. 3 )

iii. ''ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියෙකු ලෙස චිත්තවේග සුහවාදීව හසුරවා ගැනීමේ වැදගත්කම'' පිළිබඳව පන්තියේ බිත්ති පුවත් පතට යොමු කිරීමට සුදුසු කෙටි ලිපියක් ලියන්න. සුදුසු මාතෘකාවක් යොදන්න. ( ල. 5)

06. පුද්ගලයෙකු උපන් දා සිට මිය යන මොහොත දක්වාම හැසිරෙන්නේ තම සංස්කෘතියට අනුකූලවයි.

i. බහු සංස්කෘතික ජන සමාජයක් යනු කුමක්ද? ( ල. 2 )

ii. ශ්‍රී ලංකාවේ ජීවත් වන ආගමික කණ්ඩායම් තුනක් නම් කරන්න. ( ල. 3)

iii. බහු සංස්කෘතික සමාජයක පුරවැසියෙකු වශයෙන් කටයුතු කිරීමේදී ඔබෙන් ඉටු විය යුතු යුතුකම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. ( ල. 2 1/2 + 2 1/2 = 5 )

07. ශ්‍රී ලංකාවේ මාර්ග අනතුරු අතර වර්තමානයේ සුවිශේෂී අංගයක් බවට දුම්රිය අනතුරු පත්ව ඇත.

i. දුම්රිය අනතුරු වලට වැඩි වශයෙන් බලපා ඇති හේතු දෙකක් ලියන්න. ( ල. 02 )

ii. දුම්රිය අනතුරු වළක්වා ගැනීමට අදාළව එදිනෙදා ජීවිතයේදී වැදගත් වන මාර්ග සංඥා දෙකක් නියමිත වර්ණ හා සංකේත ඇතුළත් කර ඇඳ දක්වන්න. ඒවා නම් කරන්න. ( ල. 1 1/2 + 1 1/2 = 3 )

iii. (අ) වර්තමානයේ දිනෙන් දින වැඩිවන මාර්ග අනතුරු අවම කර ගැනීමට ඔබට ඉදිරිපත් කළ හැකි යෝජනා 3ක් ලියන්න.

(ආ) ඔබේ පාසලේ සිසුන්ට සිදුවිය හැකි මාර්ග අනතුරු අවම කිරීමට පාසලෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග 2ක් ලියන්න.

08. පුද්ගල ජීවිතයේදී මෙන්ම සමාජ ජීවිතයේදී ද පුද්ගලයාට විවිධ අභියෝග වලට හා ගැටලු වලට මුහුණ දීමට සිදු වේ.

i. ඕනෑම පුද්ගලයෙකුට මුහුණ දීමට සිදුවන ''විවිධ මාදිලියේ ගැටලු'' වර්ග අතරින් දෙකක් නම් කරන්න. (ල. 02)

ii. පාසල් සිසුන් වශයෙන් ඔබ දෛනිකව මුහුණ දෙන ගැටලු තුනක් ලියන්න. ( ල. 03 )

iii. (අ) අභියෝග යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) අභියෝග ජයගැනීමට ප්‍රගුණ කළ යුතු මනෝ සමාජීය නිපුණතා තුනක් ලියන්න. ( ල. 03 )

තෙවන වාර පරීක්ෂණය - 2019

# පුරවැසි අධ්‍යාපනය

08 ශ්‍රේණිය

පිළිතුරු පත්‍රය

**I කොටස**

| | | |
|---|---|---|
| 01. 4 | 11. 3 | 21. 3 |
| 02. 3 | 12. 4 | 22. 4 |
| 03. 4 | 13. 4 | 23. 3 |
| 04. 3 | 14. 1 | 24. 4 |
| 05. 2 | 15. 2 | 25. 3 |
| 06. 3 | 16. 3 | 26. 2 |
| 07. 2 | 17. 4 | 27. 1 |
| 08. 4 | 18. 3 | 28. 2 |
| 09. 1 | 19. 2 | 29. 2 |
| 10. 2 | 20. 1 | 30. 2 |

**II කොටස**

01. i. ජනතාවගෙන් ලබා ගන්නා බදු මුදල්
රජයේ වෙනත් ආදායම්

ii. ප්‍රවාහනය / තැපැල් හා විදුලි පණිවිඩ සේවා / බැංකු සේවා

iii. හෘද රෝග / දිය වැඩියාව / වකුගඩු රෝග / පිළිකා

iv. න්‍යෂ්ටික පවුල / විස්තෘත පවුල

v. ආරක්ෂාවට ඇති අයිතිය සහභාගිත්වයට ඇති අයිතිය
සංවර්ධනයට ඇති අයිතිය පැවැත්මට ඇති අයිතිය

vi. පාසල තුළ/ පවුල තුළ / සමාජය තුළ මීට අමතරව ස්ථාන නම් කර ඇතිනම් ලකුණු ලබා දෙන්න.

vii. ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය

viii. නියමිත වෛද්‍ය උපදෙස් පිළිපැදීම ඖෂධවල නියමිත මාත්‍රාව භාවිතා කිරීම
නියමිත වේලාවට ඖෂධ භාවිතා කිරීම කල් ඉකුත්වීමේ දිනය පිළිබඳව සැළකිලිමත් වීම
ඖෂධ නියමිත උෂ්ණත්වයේ ගබඩා කිරීම භාවිතයට පෙර අසුරනයේ ඇති උපදෙස් පිළිබඳව සැළකිලිමත් වීම.
අන්තරායණකාරී ඖෂධ භාවිතයෙන් වැළකීම.

ix. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශය පෞද්ගලික අංශය ස්වයං රැකියා

x. රැකියා මත අත්දැකීම් ලබා ගැනීම. සම්බන්ධතා පැවැත්වීම හා ප්‍රතිපෝෂණය
රැකියාවෙන් පසු අත්දැකීම් ලබා ගැනීම පංති කාමර ඉගනීම

02. i. අනුරාධපුර යුගයට අයත් බුද්ධාස රජතුමාගේ රාජ්‍ය කාලයේදී ගම් දහසකට එක් වෛද්‍ය වරයෙකු බැගින් සිටීම.
රෝහල් පිහිටුවා ඒවා නඩත්තු කිරීම. ඔසු උයන් ආදිය කරවීමට රජවරු ක්‍රියා කර ඇත.
ආගමික ස්ථාන මුල් කරගෙන අධ්‍යාපන ආයතන පැවැත්වීම.

ii. අධ්‍යාපනය / ප්‍රවාහනය / ජල සම්පාදනය / සෞඛ්‍ය / විදුලිය / සමූපකාර / පණිවිඩ හුවමාරුව / ආරක්ෂක සේවා / තැපැල් සේවය

iii. පාසල තුළ ක්‍රියාත්මක සාහිත්‍ය සමිති, ආගමික සමිති, විවාද කණ්ඩායම, ශිෂ්‍ය නායක මණ්ඩලය, ක්‍රිඩා සමිති, ශිෂ්‍ය භට කණ්ඩායම, පරිසර භට කණ්ඩායම, තූර්යය වාදක කණ්ඩායම යනාදි තම පාසල තුළ ක්‍රියාත්මක සමිති සමාගම් දෙකක් ලියා තිබීම.
මෙහි දෙවන කොටස තුළ යහපත් පුරවැසියා යනු යුතුකම් ඉටු කරමින් වගකීම් දරමින් සිය අයිතිවාසිකම් භුක්ති විඳින අයෙක් බව අවබෝධ කරගෙන ලියා තිබීමත් ඉවසීම, කරුණාව, සහයෝගය, පරෝපකාරී බව, සහයෝගය, සහකම්පනය, පොදු දේපළ ආරක්ෂා කිරීම, ජාතික උරුම ආරක්ෂා කිරීම යනාදි ගුණාංග ඉහත ක්‍රියාකාරකම් තුළින් වර්ධනයන වන බවත් එය සිදුවන ආකාරයත් පැහැදිලි කර තිබිය යුතුය.

03. i. පරිසර සංරක්ෂණය - පරිසර අමාත්‍යාංශය මධ්‍යම පරිසර අධිකාරිය වනජීවී දෙපාර්තමේන්තුව

ii. යුතුකම් - පරිසර සංරක්ෂණය සඳහා උපරිම දායකත්වය සැපයීම
පරිසර නීති රීති ක්‍රියාත්මක කිරීම සඳහා උපරිම සහය ලබා දීම
පරිසර හානි පිළිබඳ මහජන පැමිණිලි වලට යහපත් ප්‍රතිචාර දැක්වීම.
පරිසර සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම.

iii. මෙම පිළිතුර සඳහා එක් පොදු සේවාවක් උදාහරණ ලෙස ගෙන ඒ හා සම්බන්ධ පුරවැසි යුතුකම් දෙකක්වත් ලියා තිබිය යුතුය. එමෙන්ම එම යුතුකම් සේවාවන් ප්‍රයෝජනයට ගන්නා සියලුම පුරවැසියන් ඉටු කිරීම තුළින් පොදු සේවා වල පැවැත්ම හා ගුණාත්මක සංවර්ධනය තහවුරු වන බව අවධාරණය කර ඇත්නම් ලකුණු පිරිනමන්න.

04. i. සාකච්ඡා මගින් නිවැරදි තීරණ වලට එළඹීම.
සැම දෙනාගේම කැමැත්ත මත විමසීම හා එකඟවීම.
නායකත්වයට ගරු කිරීම
සහයෝගයෙන් කටයුතු කිරීම.
අධ්‍යාපනය/ භෞතික සම්පත්/ නිළ ඇඳුම් / පුස්තකාල ක්‍රීඩා හා වෙනත් පහසුකම් සමානව ලැබීම.
උපේක්ෂාවෙන් ජය පරාජය භුක්ති විදීම.
සාමකාමීව ගැටලු නිරාකරණය කර ගැනීම.
සමිති සමාගම් වල තනතුරු ලබා ගැනීම.
අදහස් ප්‍රකාශ කිරීම හා ඡන්දය ලබා දීම.
පාසල තුළ පොදු නීති රීති සම්ප්‍රදායන් පිළිගැනීම, අනුගමනය හා ආරක්ෂා කිරීම.

ii. පාසල් කාලය තුළ දරුවන්ට ආරක්ෂාව සැපයීම.
දරුවන්ගේ විවිධ දක්ෂතා දියුණු කර ගැනීමට ඉඩ ප්‍රස්තාව සංවිධානය කර දීම.
පාසලේ විනය නීති කාටත් පොදු වීම.
පාසල් පෙළ පොත්, නිළ අඳුම්, දිවා ආහාර, පුස්තකාල හා විද්‍යාගාර පහසුකම් සමව ලැබීම.
විෂය සමගාමී මෙන්ම විෂය භාහිර ක්‍රියාකාරකම් වල නිරත වීමට සමාන අවස්ථා ලබා දීම.

iii. සාහිත්‍ය සමිති, ආගමික සමිති, ක්‍රීඩා සමිති ආදී සමිති
ජාතික උත්සව, ආගමික උත්සව, සංස්කෘතික උත්සව
නර්තනයට, ගායනයට, චිත්‍ර ඇදීමට, සාමාන්‍ය දැනීම, රචනා, විවාද වැනි තරග සංවිධානය කර පැවැත්වීම.
ශිෂ්‍ය නායක, පන්ති නායක, විෂය නායක, ක්‍රීඩා නායක වශයෙන් වගකීම් දැරීම.
ශිෂ්‍යභට, පරිසර භට, බාල දක්ෂ, ප්‍රථමාධාර සේවා පුහුණුවීම් හා අත්දැකීම් ලබා දීම.
අධ්‍යාපන චාරිකා, ක්ෂේත්‍ර චාරිකා, ගවේෂණ චාරිකා, විනෝද චාරිකා සංවිධානය.
මෙම කරුණු අතරින් ඕනෑම කරුණු දෙකක් ලියා තිබීම ප්‍රමාණවත් අතර ඉන් එක් විෂය සමගාමී ක්‍රියාකාරකමක් ඉටු කිරීමේදී මෙහි පළමු කොටසට අදාළ ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ ප්‍රදර්ශනය වන බවත් නිදසුන් මඟින් පැහැදිලි කර තිබිය යුතුය.

05. i. භාවනා කිරීම / මල් වැවීම/ පරිසරය රස විදීම / ආගමික කටයුතු වල යෙදීම/ හුරතල් සතුන් ඇති කිරීම

ii. පෙර සූදානම / කාලසටහනකට වැඩ කිරීම/ අන් අයගේ උදව් හා උපදෙස් ලබා ගැනීම / සවන් දීම/ නීති රීති හා සිරිත් විරිත් පිළිපැදීම / තමා පිළිබඳව විශ්වාසය ඇති කර ගැනීම.

iii. පහත සඳහන් කරුණු සලකා බලා ලකුණු 5 පිරිනමන්න.
මාතෘකාවක් නිර්මාණය කර තිබීම - ලකුණු 01
චිත්තවේග යනු මොනවාද? යන්න පැහැදිළි කිරීමට- ලකුණු 01
සුභවාදී හා අසුභවාදී චිත්තවේග වලට නිදසුන් දක්වා තිබීම - ලකුණු 01

චිත්තවේග සුභවාදීව හසුරුවාගත හැකි ක්‍රම හා වැදගත්කම ලියා තිබීම - ලකුණු 01
පැහැදිලි, නිර්මාණශීලී නිමාවට - ලකුණු 01


06. i. විවිධ සංස්කෘතික ලක්ෂණ වලින් හෙබි ප්‍රජාව වාසය කරන සමාජ බහු සංස්කෘතික ජන සමාජ වේ.

ii. බෞද්ධ/ හින්දු/ ඉස්ලාම්/ කතෝලික සහ ක්‍රිස්තියානි යන ආගමික කණ්ඩායම්

iii. සෑම ජන වර්ගයකටම අයත් පුද්ගලයන්ට ගරු කිරීම.
සෑම ජන වර්ගයකටම අයත් පුදගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.
කිසිදු ජන වර්ගයක්, ආගමික කණ්ඩායමක් උසස් හෝ පහත් කොට නොසැළකීම.
සෑම සංස්කෘතික උරුමයක්ම ආරක්ෂා කිරීම.
අන් මතවාද, අදහස් ඉදිරිපත් කිරීමට ඇති අයිතිය පිළිගැනීම හා ඊට ඇහුම්කන් දීම.
තම යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීම වැනි කරුණු අතරින් දෙකක් පැහැදිලිව විස්තර කර තිබීම.

07. i. දුම්රිය මාර්ගයේ පදිකයින් නොසැළකිළිමත්ව ගමන් කිරීම. (දුරකථන භාවිතා කරමින්, ඡායාරූප ගනිමින්)
දුම්රිය මාර්ග හරහා මාර්ග සංඥා නොතකා රථ වාහන ධාවනය කිරීම.
දුම්රිය මාර්ග සම්බන්ධයෙන් වන කාර්මික දෝෂ
දුම්රිය හරස් පාරවල ආරක්ෂිත ගේට්ටු නොතිබීම
දුම්රිය මාර්ග දෙපස අනාරක්ෂිත ලෙස පදිංචි වී සිටීම.

ii.




iii.(අ) රියදුරන්ට නිසි පුහුණුව ලබා දීම.
රියදුරෙක් වීමට අවශ්‍ය සුදුසුකම් පරිකෂාව
ගුවන් පාලම් භාවිතය
ධාවනය වන වාහන වල තත්වය පරික්ෂා කිරීම.
උමං මාර්ග භාවිතය
මාර්ග අකතුරු පිළිබඳව සිසුන් හා ජනතාව දැනුවත් කිරීම.
මාර්ග සංඥා පැහැදිළිව ප්‍රදර්ශනය කිරීම.
රථ වාහන පොලිසියේ සහය ලබා ගැනීම.
මාර්ග නීති රීති කඩකරන්නන්ට දැඩි දඩුවම්දීම යනාදි කරුණු 03ක්

(ආ) සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
රථ වාහන පොලිසියේ සහය ලබා ගැනීම.
පාසල ඉදිරිපිට රථ නියාමකයන් වශයෙන් සිසුන්ද යොදවා තැබීම
පාසල් වෑන් රථ, හා පෞද්ගලික වාහන පාසල ආරම්භ කරන හා අවසන් කරන වෙලාවන් හි පාසල ඉදිරිපිටම නැවැත්වීම තහනම් කිරීම.

08. i. භෞතික ගැටලු/ මානසික ගැටලු/ ආර්ථික ගැටලු/ තාක්ෂණික ගැටලු/ පරිසර ගැටලු/ සමාජමය ගැටලු/ කායික ගැටලු යන කරුණු අතරින් දෙකක්.

ii. ආහාර හා පෝෂණ ගැටලු
තමන් ආශා කරන දේවල් නොලැබීම
ආර්ථික අපහසුතා
ආරක්ෂාව හා සුරක්ෂිත බව නොමැති විට
පාසල් වල පවත්නා සම්පත් හිඟය
විභාග වලින් අසමත් වීම
ආදරය නොලැබීම යනාදී කාලීනය දක්නට ඇති ගැටලු 03ක්

iii.(අ) ජීවිත ඉලක්ක ජය ගැනීමේදී සිදුවන විවිධ බාධා අභියෝග වේ.

(ආ) ඵලදායි සන්නිවේදනය
නිවැරදි තීරණ ගැනීම
ගැටලු විසඳීම
විචාරශීලි චින්තනය
නිර්මාණශීලි චින්තනය යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා
කරුණාව, මුදිතාව
තමා පිළිබඳ මනාඅවබෝධය
චිත්තවේග හැසිරීම ආදී පිළිතුරු වලින් තුනක්